# 6 මං තනන්නෝ

19 වන ශත වර්ෂයේ මැද භාගයේ දී පමණ ආරම්භ වූ 'කෙටිකතාව' නමැති සාහිත්‍යාංගය අද වන විට පෙර'පර දෙදිග ම අතු ඉති ලා වැඩුණු ප්‍රබල කලා මාධ්‍යයක් බවට පත් ව තිබේ.

කෙටිකතාව නමැති සාහිත්‍යාංග යට අනන්‍ය වූ ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමටත්, කෙටිකතාවක් යනු කුමක් ද යන්න සරල ව පැහැදිලි කර ගැනීමටත් ඔබට මඟ පෙන්වීම මේ පාඩමේ අරමුණ යි.



මෙහි පළ වන 'මං තනන්නෝ' කෙටිකතාව මහගම සේකර විසින් රචිත ය. කවියකු, චිත්‍ර ශිල්පියකු, නවකතාකරුවකු හා සාහිත්‍ය විචාරකයකු වන මහගම සේකරගේ මේ කෙටි කතා ව සරල සිද්ධියක් හා එක් ප්‍රධාන චරිතයක් අනාවරණය කරන නිර්මාණයක් සේ හැඳින්විය හැකි ය.

නගර සභාවේ කම්කරුවෝ ඇවිත් පාර සුද්ද කරති. පාර දෙපස කානු ගොඩ වී වල් පැළෑටි වැවී ඇත. එක් කම්කරුවෙක් ඒ වල් පැළෑටි ද පාරට නැමුණු ගස් අතු ද කපා දමයි. තවෙකෙක් එසේ කපා දමන අතු රිකිලි අසල නවත්වා ඇති කරත්තයට ගෙන ගොස් දමයි. තවත් දෙදෙනෙක් කානු හාරමින් ඒ පස් දමා පාර දෙපස ගොඩ කරති. එසේ පස් දමා ඇති කොටසේ පාර බොහෝ සෙයින් පළල් වී ඇත්තාක් මෙන් පෙනේ. ඔවුහු උස් හඬින් කතාබහ කරමින් කඩිසර ලෙස වැඩෙහි යෙදී සිටිති. කරත්තයේ බැඳ සිටින ගොනා පමණක් සෙමෙන් සෙමෙන් තලුමරමින් ඔහේ කරබා ගෙන සිටී.

මහේන්ද්‍ර ඉස්තෝප්පුවේ හාන්සි පුටුවෙහි වාඩි වී බොහෝ වේලාවක් ඔවුන් දෙස බලා සිටියේ ය. ඔහු පොතකුත් රැගෙන ඉස්තෝප්පුවට ආවේ එය කියවීමට සිතා ගෙන ය. හෙට පන්තියේ දී පැවැත්විය යුතු දේශනයට සූදානම් වීම සඳහා අද අවශ්‍යයෙන් ම මේ පොත කියවිය යුතු ය. පොත මඳක් කියවන විට පාරේ වැඩ කරන මිනිසුන් කෙරෙන් සිනා හඬක් ඇසුණෙන් ඔහු පොත වසා දමා එදෙස බැලී ය. සිනාවට හේතුව මහේන්ද්‍රට වටහා ගත නොහැකි විය. එය ඔවුන්ගෙන් කිසිවකු කළ විහිළුවක් වීමට පුළුවන.

"හරියට වතුර තිබහයි. යමු ද තේ එකක් බීලා එන්ඩ?" පාර කපන්නන්ගෙන් එකෙක් යෝජනා කළේ ය.

"මේ ටිකත් කපල ම යමු" එවිට අනෙකා කී ය.

ගිනි අව්වේ පිච්චි පිච්චී වැඩ කරන මේ මිනිසුන් කෙරෙහි භක්තියක් මහේන්ද්‍රට ඇති විය. මාසයකින් පමණ වැස්සක් නොවට හෙයින් පස හොඳට ම තද වෙලා ය. පසේ තදකම උදලු පහර පොළොවේ වදින හඬින් ම දැනේ. සුළු වැටුපක් ලබා ගැනීම සඳහා මේ මිනිසුන් කොතරම් වෙහෙස විය යුතු ද? ඔවුන්ට ලැබෙතැයි සිතිය හැකි වැටුප ගැන මහේන්ද්‍ර සිතා බැලුවේ ය. කිසි සේත් කය නොවෙහෙසන තමාට ඔවුන්ගේ මෙන් හත්අට ගුණයක වැටුපක් ලැබෙතැයි ඔහුට සිතුණේ ය.

මිනිසුන් වැඩ කරන තැනට යාමට ආසාවක් මහේන්ද්‍රට උපන්නේ ය. ඔහු පොත හකුළා හාන්සි පුටු අත මත තබා මිදුලට බැස්සේ ය.

"තාත්තේ මාත්..." සාලයේ යසෝමා අසල සිටි විමල්, මහේන්ද්‍ර මිදුලට බසිනු දැක ඔහු දෙසට එන්නට විය.

"පුතත් එනව ද...? හා එන්ඩ එහෙනං" මහෙන්ද්‍ර මඳක් නැවතුණි.

"ඔයා කොහෙ ද යන්නෙ ඇ?" යසෝමා ඉස්තෝප්පුවට කර පොවා බලා ඇසුවා ය.

"කොහෙවත් නෑ... මෙතන පාරට."

"පුතත් එක්ක යනව නම් ඉන්ඩ, සපත්තු දෙක දානකල්..." යසෝමා කීවා ය.

"විමල්... එන්ඩ පුතේ සපත්තු දාන්ඩ."

මහේන්ද්‍ර විමල්ගේ අතින් අල්ලාගෙන ඔහුත් සමග මිනිසුන් වැඩ කරන තැනට ගියේ ය.

කම්කරුවන්ගේ පිටේත්, දෑතේ රෝම ගස්වලත් රැඳුණු දහදිය බින්දු හිරු රැස් වැටී දිලිහෙයි. ඔවුන්ගේ අත්වල හා ළමැද මස් පිඬු මනා සේ කැපී පෙනෙයි. මහේන්ද්‍ර තමාගේත් ඔවුන්ගේත් දෑත් සසඳා බැලී ය. තම සුකුමාරකම ගැන ලැජ්ජාවක් මහේන්ද්‍රට ඇති විය.

"මේ මිනිස්සු තමයි මහ පොළොවෙ නියම පුත්තු..." මහේන්ද්‍ර තමාට ම කියා ගත්තේ ය. "අපි නෙමෙයි."

මහේන්ද්‍රගේ පැමිණීමෙන් පසු කම්කරුවෝ කතාව නවත්වා කරබා ගෙන වැඩ කිරීමට පටන් ගත්හ. ඔවුන් නිහඬ ව සිටීම මහේන්ද්‍රගේ සිතට කරදරයක් විය.

"පොළොව හරි තදයි වගේ" ඒ නිශ්ශබ්දතාව බිඳ දමා ඔවුන් සමග කතාවට වැටෙන අටියෙන් මහේන්ද්‍ර කී ය.

"තදයි කිව්වට තදයි නෙමෙයි සර්" එක් මිනිහෙක් මහේන්ද්‍ර දෙස බලා උදැල්ල පසෙක තබමින් කී ය.

"බොරලු පොළොවනෙ... වහින කාලෙට හොඳට ම බුරුල්. පායන කාලෙට හොඳට ම තදයි."

"සර්ලා ළඟදි නේ ද මේ ගෙදෙට්ට ආවේ?" ඔහු ඇසී ය.

"ගිය මාසෙ" මහේන්ද්‍ර උත්තර දුන්නේ ය. "අපි ඉස්සර හිටියෙ කුරුණෑගල."

"බබා... කොහොම ද බබා?" ඊ ළඟට ඔහුගේ අවධානය විමල් කෙරේ යොමු විය. "බබාට මලක් කඩලා දෙන්ඩ ද?" ඔහු අසල පිහිටි වද පඳුරකින් රත් පැහැති මලක් කඩා ගෙන විමල් දෙසට දිගු කළේ ය.

විමල් පියා දෙස බැලුවේ ය. "ගන්ඩ පුතා" මහේන්ද්‍ර කී ය. විමල් මල අතට ගත්තේ ය. පාරේ වැඩ කරන කම්කරුවන් සමග තමා ආධ්‍යාත්මික වශයෙන් එකතු වූවාක් මෙන් මහේන්ද්‍රට හැඟුණේ ය. කය වෙහෙසා වැඩ කරන මොවුහු ද රටට විශාල සේවයක් කරති. මොවුන් කපන පාර මහේන්ද්‍රට සංකේතයක් ද විය. එය සෞභාග්‍යය හා සහෝදරත්වය කරා යන මාවතේ සංකේතය යි. තමා සෙරෙප්පු කුට්ටමක් පය ලා සිටීම ගැන ලැජ්ජාවක් මහේන්ද්‍රට ඇති විය. මොවුහු තමා මෙන් මහ පොළොව අපවිත්‍ර දෙයක් කොට නො සලකති.

දහදිය වගුරුවා ගෙන දූලි, පස් ගත වකා ගෙන මොවුන් සමග එක් වී පොළොව කොටන්නට බලවත් ආසාවක් මහේන්ද්‍රට ඇති විය. එහෙත් ඔහුගේ සමාජ තත්ත්වය ඊට බාධාවක් විය. එසේ කළ හොත් අවට ගෙවල පදිංචිකරුවන් තමා පිස්සකු කොට සලකනු ඇතැ යි මහේන්ද්‍රට සිතුණේ ය. "අර මහත්තයා කොහෙ ද ලොකු රස්සාවක් කරන කෙනෙක් කිව්ව නේ ද? අර මිනිස්සුත් එක්ක එක්කහු වෙලා පාර හදන්නෙ. මොළේ හොඳ නැතුව ඇති" අවට ගෙවල අයට පමණක් නො ව, මේ කම්කරුවන්ට ද එය පුදුමයක් වනු ඇත. එබැවින් මහේන්ද්‍ර ඒ ආසාව යටපත් කර ගත්තේ ය.

අනුන්ගේ සමච්චලයට භාජන නො වී මේ වැඩට ද හවුල් විය හැකි ක්‍රමයක් ගැන මහේන්ද්‍ර සිතා බැලුවේ ය. ඔහු පිහියක් අතට ගෙන පාරට නැමී තිබුණු කූඩා අතු රිකිලි කපන්නට විය. ඔහු එය කළේ තමා විනෝදයට සෙල්ලමක් කරන විලාසයක් අවට සිටියවුන්ට හැඟෙන පරිදි ය. එහෙත් මහේන්ද්‍රට එය විනෝද ක්‍රීඩාවක් පමණක් නො ව, නියම වැඩක් නොහොත් නියම වැඩක සංකේතයක් ද විය. පාරට නැමුණු අතු කපා දැමීමෙන් තමා ද සුළු වශයෙන් හෝ මේ මිනිසුන්ගේ වැඩට හවුල් වෙතැයි මහේන්ද්‍රට සිතුණේ ය.

එක් අත්තක මදු වැල් ගාලක් පැටලී තිබෙනු දුටු මහේන්ද්‍රට තවත් අදහසක් පහළ විය. ඔහු මදු වැල් ගොන්න කඩා අතට ගෙන අනිත් අතින් විමල් ද වඩා ගෙන කරත්තයේ බැඳ සිටි ගොනාට සමීප විය.

"මේ ගොනා අනිනව ද?" ඔහු කම්කරුවන්ගෙන් ඇසුවේ ය.

"නෑ."

මහේන්ද්‍ර දරුවා වඩා ගත් වන ම මදුවැල් ගොන්න ගොනාගේ මුවට ළං කළේ ය.

"අපි මේ තැත්තට කන්න දෙමු පුතේ... ඈ...?"

ගොනා ආසාවෙන් මදු වැල් කන්නට විය. පාරේ වැඩ කරන අයට තමා සංග්‍රහයක් කළාක් මෙන් මහේන්ද්‍රට හැඟුණේ ය.

ගොනා මදුවැල් කන හැටි විමල් උනන්දුවෙන් බලා සිටියේ ය. මහේන්ද්‍ර ගොනාගේ හිස අත ගාන්නට විය.

යසෝමා ඉස්තෝප්පුවට පැමිණ මහේන්ද්‍රට අඬ ගැසුවා ය. "මේ... මෙහෙ ඇවිත් යන්ඩකො..."

"තේ ලෑස්තියි" ඈ තමා වෙත පැමිණි මහේන්ද්‍රට පහත් හඬින් කීවා ය.

මහේන්ද්‍ර තලගුලිත් කෙසෙල් ගෙඩිත් කා තේ බීවේ ය. පාරේ වැඩ කරන කම්කරුවන් ඔහුට මතක් විය.

"අර මිනිස්සුන්ටත් වතුර තිබහ ඇති. තේ ටිකක් දුන්නොත් නරක ද?" මහේන්ද්‍ර යසෝමා දෙස බලා කීවේ ය.

"ඒ මිනිස්සු කඩේට ගිහිං බොන්නැතෑ" යසෝමා සිනාසෙමින් කීවා ය. "මේ අහල පහළ ගෙවල්වල කවුරුවත් එහෙම දෙන සිරිතක් නෑ."

මහේන්ද්‍ර තේ බී ඉස්තෝප්පුවට ආවේ ය.

පාරේ වැඩ කළ කම්කරුවෝ උදලු, කැති ආදි උපකරණ ගෙනවුත් මහේන්ද්‍රගේ මිදුලේ පසෙක තැබූහ. "අපි කඩේට ගිහින් එන්නං සර්" ඔවුන්ගෙන් එකෙක් කීවේ ය.

"හොඳයි" මහේන්ද්‍ර ඔවුන් දෙස බලා සිනා මුසු මුහුණින් කී ය. කම්කරුවන් උස් හඬින් කතා කරමින් වංගුව හැරී නොපෙනී යන තුරු මහේන්ද්‍ර ඔවුන් දෙස බලා සිටියේ ය.

**(නව යුගය - 1972/11/12)**

කෙටිකතාව නවකතාවෙන් වෙනස් ය. එහෙත් මේ කතා වර්ග දෙක ම ප්‍රබන්ධ කරන ලද කතා ය.

කෙටිකතාවක් යනු එක් ප්‍රබල සිද්ධියක් වටා ගෙතෙන කතා ය. 'මං තනන්නෝ' කෙටිකතාව රචනා වී ඇත්තේ කම්කරුවන් පිරිසක් පාරක් සකස් කිරීම පිළිබඳ සිද්ධියකි. ඒ සිදුවීම විකසනය කිරීමෙන් රසවත් කෙටිකතාවක් නිර්මාණය කර ගෙන තිබෙනු දැකිය හැකි ය. මෙම කෙටිකතාව එම කේන්ද්‍රීය සිද්ධිය වටා මනා වියමනක් සේ සියුම් ව ගෙතී ඇත.

කෙටිකතාවක චරිත කිහිපයක් තිබිය හැකි ය. එහෙත් ප්‍රධාන චරිත කිහිපයක් තිබිය නොහැකි ය. හොඳ කෙටිකතාවක ප්‍රධාන චරිත තිබිය හැකි වන්නේ එකක් පමණි. මං තනන්නෝ කෙටිකතාවේ ප්‍රධාන චරිතය මහේන්ද්‍ර යි. ඔහුගේ බිරිඳ, කුඩා පුතා, සහ කම්කරුවෝ අවශේෂ චරිත වෙති. නමුත් අනෙකුත් චරිත ප්‍රධාන නො වී ප්‍රධාන චරිතය බැබළවීමට එම චරිත උදව් වෙයි.

කෙටිකතාවක් යනු සත්‍ය කතාවක් නො වේ. එය කල්පිත හෙවත් සිතින් මවාගෙන ගොඩ නගන ලද කථාවකි. එහෙත් එම කතාවට පාදක වන්නේ නිර්මාණකරුවා ලත් සැබෑ අත්දැකීමක් විය හැකි ය. අත්දැකීමක් එලෙස ම ලියූ කල එය නිර්මාණයක් වන්නේ නැත. රචකයා තම පරිකල්පනය මෙහෙයවා තමා ලත් අත්දැකීම ප්‍රතිනිර්මාණය කරයි.

කතන්දරයක් නම් මුල, මැද, අග මනා සේ ගැළපිය යුතු ය. ඔබ දන්නා ජන කතාවක් හෝ සුරංගනා කතාවක් සිහියට නගා ගන්න. "ඔන්න එකෝමත් එක කාලෙක..." ආදි වශයෙන් ඇරඹී සිද්ධි හා අවස්ථා සිදු වූ අනුපිළිවෙළින් කියා, කතාව හමාර කරනු දක්නට ලැබේ. එහෙත් කෙටිකතාවක තිබිය යුත්තේ මනා හේතුඵල සම්බන්ධතාවක් මත ගොඩ නැගුණු කතා වින්‍යාසයකි. එය කතාවක් නො වේ. "වැද්දා බිසව හැර ගියේ ය. ඉන් පසු බිසව මළා ය" යනු කතාවකි. "වැද්දා බිසව හැර ගියේ ය. ඒ ශෝකය දරා ගත නොහැකි ව බිසව මළා ය" යනු කථා වින්‍යාසයකි. එහි බිසව මිය යෑමට හේතුව පාඨකයාට පැහැදිලි ය. කෙටිකතාවක් ද මෙපරිද්දෙන් මනාව සැකසුණු කතා වින්‍යාසයකින් යුක්ත විය යුතු ය. එවිට කෙටිකතාව කෙරෙහි පාඨක විශ්වාසය නො බිඳී පවතියි.

'මං තනන්නෝ' කෙටිකතාවේ එන මහේන්ද්‍ර ඉස්තෝප්පුවේ හාන්සි පුටුවට ආවේ පොතක් කියවීමට යි. එහෙත් පාරේ වැඩ කරන කම්කරුවන්ගේ සිනා හඬින් අවධානය බිඳීම නිසා ඔහු පොත වසා දමා එදෙස බලයි. මහේන්ද්‍රට ඔවුන්ගේ කතාබහ ඇසෙන්නේ එවිට ය. මේ ආදි වශයෙන් මං තනන්නෝ කෙටිකතාවේ සිද්ධි මනා ව එකිනෙකා ගළපා ඇත්තේ පාඨක විශ්වාසය නොබිඳෙන පරිද්දෙනි.

කෙටිකතාවක් කියවීමෙන් පාඨකයාට ආස්වාදයක්, විනෝදයක් ලැබේ. එහෙත් හොඳ කෙටිකතාවකින් පාඨකයාට සතුටට අමතර ව ගැඹුරු ප්‍රඥාවක් ලැබේ. එය ජීවිතය පිළිබඳ ලබන අවබෝධයකි. 'මං තනන්නෝ' කෙටිකතාවේ මතුපිටින් දිවෙන ආස්වාදයට යටින් මනුෂ්‍යත්වය පිළිබඳව මානව දයාව පිළිබඳව, පන්ති පරතරය පිළිබඳව, ගැඹුරු අරුත් සම්පාදනය වෙයි.

කතාව රසවත් ව කීමට සංකේත යොදා ගැනීමට කෙටිකතාකරුවාට පුළුවන. කෙටිකතාව සංක්ෂිප්ත මාධ්‍යයක් බැවින් සංක්ෂිප්තතාව රැකීම උදෙසා ද සංකේතවලින් මහඟු පිටිවහලක් ලැබේ. වචන දහස් ගණනකින් කිව යුතු දෙයක් එක් ප්‍රබල සංකේතයකින් කිව හැකි ය.

"කරත්තයේ බැඳ සිටින ගොනා පමණක් සෙමෙන් සෙමෙන් තලුමරමින් ඔහේ කරබාගෙන සිටී" යනුවෙන් 'මං තනන්නෝ' කෙටිකතාවේ සඳහන් ප්‍රකාශයෙහි 'කරත්තයේ බැඳි ගොනා' සංකේතයකි. නිර්ධන පන්තික දුක් විඳින මිනිසා කරත්තයක බැඳි ගොනෙකු සේ ය. ඔහුට ගැලවීමක් නැත. කරබා ගෙන බර ඇදිය යුතු ය. මෙපරිද්දෙන් එම සංකේතය අවැසි තරම් දිග්ගස්සා වචන බොහෝ ගණනකින් අර්ථ ගැන්විය හැකි ය.

මෙබඳු ලක්ෂණ අන්තර්ගත කතාවක් සාර්ථක කෙටිකතාවක් ලෙස හැඳින්විය හැකි ය. සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම ආකස්මික ව කළ හැකි දෙයක් නොවේ. ඒ සඳහා නිරන්තරයෙන් පුහුණු වීම හෙවත් සතතාභ්‍යාසය අවශ්‍ය ය; විශිෂ්ට ගණයේ කෙටිකතාකරුවන්ගේ නිර්මාණ කියවා රස විඳිය යුතු ය; කෙටිකතාව සම්බන්ධයෙන් ලියැවුණු පොත පත, විචාර ග්‍රන්ථ පරිශීලනය කළ යුතු ය. මේ සියලු කාරණා එක්තැන් වූ කල අවසන උත්තම ගණයේ නිර්මාණයක හිමිකරුවකු වීමට ඔබට ද හැකි වනු ඇත.

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| ප්‍රතිභාව | - | අපූර්ව වස්තුවක් නිර්මාණය කිරීමේ හැකියාව |
| ප්‍රබන්ධ කථා | - | අලුතින් නිර්මාණය කරන ලද කතාව |
| පරිකල්පනය | - | අනුමාන සිතිවිල්ල |
| ප්‍රතිනිර්මාණය | - | නැවත සකස් කොට දැක්වීම, යළි ගොඩ නැංවීම |
| හේතුඵල සම්බන්ධතාව | - | සිද්ධි එකිනෙක අතර පවතින විශ්වසනීය ගැළපීම |
| කථා වින්‍යාසය | - | කථාව ඉදිරිපත් කිරීමට අනුගමනය කරන ශෛලිය |
| ආකස්මික ව | - | හේතුවක් නැතිව |
| සතතාභ්‍යාසය | - | නිරන්තරයෙන් අභ්‍යාසයේ යෙදීම |
| පරිශීලනය | - | ඇසුරු කිරීම, හැදෑරීම |

## අවබෝධය

1. පොත බලමින් සිටි මහේන්ද්‍රගේ අවධානය පොතින් ගිලිහුණේ කුමන හේතුවක් නිසා ද?
2. තමාගේත් කම්කරුවන්ගේත් දෑත් සසඳා බැලූ මහේන්ද්‍ර ලැජ්ජාවට පත් වූයේ ඇයි?
3. කම්කරුවන් සමග එක් ව පොළොව කොටන්නට සිතුණු සිතිවිල්ල ක්‍රියාවට නැංවීමට නොහැකි ලෙස කථකයාට තිබූ බාධාව කුමක් ද?
4. පාඩමේ විස්තර වන සංකේතයට අමතර ව මෙම කෙටිකතාවේ අන්තර්ගත තවත් ප්‍රබල සංකේතයක් ලියන්න.
5. කම්කරුවන් වැඩ කරන ස්ථානයට මහේන්ද්‍ර පැමිණි පසු ඔවුන් කරබා ගෙන වැඩෙහි යෙදෙන්නට ඇත්තේ කුමන කරුණක් නිසා විය හැකි ද?

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් අනුක්ත පදවල උක්ත රූප ලියා දක්වන්න.**

   i. සේකරයන් -
   ii. ශිල්පියකු -
   iii. ඔවුන් -
   iv. මිනිසුන් -

2. **පාඩමේ සඳහන් පහත පද කුමන පද වර්ගයකට අයත් දැයි ලියා දක්වන්න.**

   i. විසින් -
   ii. වැඩුණු -
   iii. සිටින -
   iv. හාරමින් -
   v. සුකුමාර -

3. **සාර්ථක කෙටිකතාවක තිබිය යුතු ලක්ෂණ හතරක් ලියන්න.**
4. **පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍ය තනන්න.**

   පරිකල්පනය
   ආස්වාදය
   ප්‍රතිභාව
   සතතාභ්‍යාසය
   ප්‍රඥාව

## ප්‍රායෝගික අභ්‍යාස

1. **තමන් ලද කවර හෝ අත්දැකීමක් ඇසුරින් කෙටිකතාවක් නිර්මාණය කරන්න.**
2. **ඔබේත් ඔබේ පන්තියේ මිතුරු මිතුරියන්ගේ කෙටිකතා නිර්මාණ ඇතුළත් කෙටිකතා සංග්‍රහයක් සකස් කරන්න.**